# පළමුවැනි කොටස

# බර සහ මිණුම්

## පරිවර්තන සාධක

**බ්‍රිතාන්‍ය ඒකක සඳහා මෙට්‍රික් ඒකක**

| | | |
|---|---|---|
| අක්කර 1 | = | හෙක්ටෙයාර් (හෙ.) 0·405 |
| රාත්තල් 1 | = | කිලෝග්‍රෑම් (කි. ග්‍රෑ.) 0·454 |
| දිගු ටොන් 1 (රා: 2240) | = | මෙට්‍රික් ටොන් (මෙ. ටො.) 1·016 |
| හොණ්ඩර 1 | = | කි. ග්‍රෑ. 50·802 |
| සැතපුම් 1 | = | කිලෝ මීටර් (කි. මී.) 1·609 |
| දිගු ටොන් සැතපුම් 1 | = | මෙ. ටො. කි. මී. 1·635 |
| අක්කරයට රාත්තල් 1 | = | හෙක්ටයාරයට කිලෝ ගෑම් 1·121 |
| අක්කරයට හොණ්ඩර 1 | = | හෙක්ටයාරයට කි. ග්‍රෑ. 125·536 |
| පයින්ට් 1 | = | ලීටර් 0·57 |
| එ. රා. ගැලුම් 1 | = | ලීටර් 4·55 |

**මෙට්‍රික් ඒකක සඳහා බ්‍රිතාන්‍ය ඒකක**

| | | |
|---|---|---|
| හෙක්ටයාර් 1 | = | අක්කර 2·471 |
| කිලෝග්‍රෑම් 1 | = | රාත්තල් 2·205 |
| මෙට්‍රික් ටොන් 1 (කි. ග්‍රෑ. 1000) | = | දිගු ටොන් 0·984 |
| මීටර් 1 | = | අඩි 3·281 |
| කිලෝ මීටර් 1 | = | සැතපුම් 0·621 |
| මෙට්‍රික් ටොන් කිලෝ මීටර් 1 | = | දිගු ටොන් සැතපුම් 0·612 |
| ලීටර් 1 | = | පයින්ට් 1·76 = එ. රා. ගැලුම් 0·219 |
| හෙක්ටයාරයට කි. ග්‍රෑ. 1 | = | අක්කරයට රාත්තල් 0·892 |

**වී/සහල් පරිවර්තන**

| | | |
|---|---|---|
| වී බුසල් 1 (රාත්තල් 46) | = | කි. ග්‍රෑ. 20·87 |
| වී මෙට්‍රික් ටොන් 1 | = | වී බුසල් 47·92 |
| | = | සහල් මෙට්‍රික් ටොන් 0·7 |
| සහල් මෙට්‍රික් ටොන් 1 | = | වී බුසල් 68·46 |
| | = | වී මෙට්‍රික් ටොන් 1·43 |
| අක්කරයට වී බුසල් 1 | = | හෙක්ටයාරයට වී කි. ග්‍රෑ. 51·55 |

# 1981 ආර්ථික ක්‍රියාකාරිත්වය, ගැටළු සහ ප්‍රතිපත්ති

## හැඳින්වීම

1981 වසරේදී ශ්‍රී ලංකාවේ මූර්ත දළ දේශීය නිෂ්පාදිතය (ද.දේ.නි.) සියයට 5.8 කින් වර්ධනය වී ඇත. මෙය 1980 පැවති වර්ධන අනුපාතිකයට සමයි. ස්ථාවර මිළ ගණන් යටතේ දළ දේශීය නිෂ්පාදිතය 1980 දී රුපියල් දශ ලක්ෂ 19,575 සිට 1981 දී රුපියල් දශ ලක්ෂ 20,706 දක්වා වැඩිවී තිබේ. කෙසේ වුවද, දළ දේශීය නිෂ්පාදිතයේ ශුද්ධ සාධක ආදයම් ඉවත් කළ විට මූර්ත දළ ජාතික නිෂ්පාදිතය සියයට 4.2 කින් වැඩි වී ඇත. 1981 වසරේදී පොළී, ලාභ හා ලාභාංශ ආදියෙන් සමන්විත වන විදේශ සාධක ආදයමෙන් විදේශයනට කළ ශුද්ධ ගෙවීම් විශාල වශයෙන් වැඩිවීම හේතුකොටගෙන, 1980 දී සියයට 5.6 ක්වූ දළ ~~දේශීය~~ නිෂ්පාදිතයේ වර්ධන අනුපාතිකය 1981 දී සියයට 4.2 දක්වා පහත වැටී ඇත.

1981 දී ජනගහණ වර්ධන අනුපාතිකය සියයට 1.7 කින් පමණ වැඩිවී යැයි ඇස්තමේන්තු කර ඇත. මෙම ඇස්තමේන්තුගත ජනගහණ වර්ධනය සමඟ ගැලපූ විට මූර්ත ඒක පුද්ගල ආදයම සියයට 2.4 කින් පමණ ඉහළ නැඟ තිබේ. 1979 හා 1980 යන වර්ෂයන්හි ඒක පුද්ගල ආදයමේ වර්ධනය පිළිවෙළින් සියයට 4.3 හා සියයට 3.6 ක් විය. පවත්නා මිල ගණන් අනුව ඒක පුද්ගල දළ ජාතික නිෂ්පාදිතය රුපියල් 5,126 ක් හෙවත් එක්සත් ජනපද ඩොලර් 265 කි.

**1·1 සංඛ්‍යා සටහන**

**ජාතික ආදයම් පිළිබඳ සංඛ්‍යා 1978—1981**

| ශීර්ෂය | වටිනාකම (රු. දශ ලක්ෂ) | | | | වර්ධන අනුපාතිකය (සියයට) | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | 1978 | 1979 | 1980* | 1981* | 1978 | 1979 | 1980 | 1981 |
| 1. පවත්නා සාධක වියදම් මිළ අනුව දළ දේශීය නිෂ්පාදිතය .. | 40,479 | 49,782 | 62,246 | 78,506 | 16·7 | 23·0 | 25·0 | 26·1 |
| 2. ස්ථාවර (1970) සාධක වියදම් මිළ අනුව දළ ජාතික නිෂ්පාදිතය .. | 17,401 | 18,501 | 19,575 | 20,706 | 8·2 | 6·3 | 5·8 | 5·8 |
| 3. පවත්නා සාධක වියදම් මිළ අනුව දළ ජාතික නිෂ්පාදිතය .. | 40,242 | 49,542 | 61,814 | 76,831 | 16·9 | 23·1 | 24·8 | 24·3 |
| 4. ස්ථාවර (1970) සාධක වියදම් මිළ අනුව දළ ජාතික නිෂ්පාදිතය** .. | 17,329 | 18,430 | 19,456 | 20,268 | 8·8 | 6·4 | 5·6 | 4·2 |
| 5. මැදි වසර ජනගහණය (දශ ලක්ෂ) .. | 14·2 | 14·5 | 14·7 | 15·0 | 1·8 | 2·0 | 1·8 | 1·7 |
| 6. ඒක පුද්ගල දළ ජාතික නිෂ්පාදිතය (රුපි.) | | | | | | | | |
| (අ) පවත්නා මිළ අනුව .. | 2,836 | 3,424 | 4,194 | 5,126 | 14·8 | 20·7 | 22·5 | 22·2 |
| (ආ) ස්ථාවර මිළ අනුව** .. | 1,221 | 1,274 | 1,320 | 1,352 | 6·8 | 4·3 | 3·6 | 2·4 |

* තාවකාලික
** සංශෝධිත

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

1980 වසර හා සැසඳීමේදී 1981 වසරේ දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධන අනුපාතිකය පවත්වා ගැනීමෙහිලා කෘෂිකාර්මික හා නිමැවුම් කර්මාන්ත අංශයන්හි යහපත් ක්‍රියාකාරිත්වය විශාල වශයෙන් ආධාර වී තිබේ. විශේෂයෙන්, 1980 දී නියඟය හේතුකොටගෙන හුදෙක් සියයට 3.1 ක වැඩිවීමක් පෙන්නුම් කළ කෘෂිකාර්මික අංශය මේ වසරේදී සියයට 6.9 ක වඩා හොඳ වර්ධනයක් පෙන්නුම් කරයි. අපනයන සැකසුම් අංශයට අවශ්‍ය යෙදවුම් සපයෙන වැවිලි කෘෂිකාර්මික භෝගයන්හි දියුණු ක්‍රියාකාරිත්වය ප්‍රධාන වශයෙන් බලපෑම නිසා, 1980 වසරට වඩා නිමැවුම් කර්මාන්ත අංශයේ නිමැවුම වැඩිවී ඇත. කර්මාන්ත අංශයේ වර්ධනයට, ඇඟලුම් අපනයන කර්මාන්තයෙන් සිදුවූ දායක වීම කැපී පෙනෙන සුළුය. වසරේ මුල් භාගයේදී පැවති

විදුලිය සැපයීමේ අඩුකම හා ඛනිජ තෙල් පිරිපහදුව නඩත්තු කටයුතු සඳහා තාවකාලිකව වැසීම, සමස්තයක් වශයෙන් ගත් කල 1981 දී, කර්මාන්ත අංශය කෙරෙහි ඉතා අයහපත් අන්දමින් බලපා ඇත.

උද්ධමනකාරී පීඩනයන් අඩු කිරීමේ අරමුණින් 1981 දී, පැනවූ ණය සීමාවන් හා රජයේ වියදම් වඩා තාත්වික වර්ධනයක පැවතීම හේතුකොටගෙන දළ දේශීය නිෂ්පාදිතයෙන් අඩකටත් වඩා දායකවන තැනීම් කටයුතු, වෙළෙඳ, බැංකු කටයුතු හා අනෙකුත් සේවා අංශයන්හි වර්ධන වේගය අඩු වී ඇත. ඇත්ත වශයෙන්ම, තැනීම් කටයුතු අංශයේ වූ වර්ධනයෙහි පසුබැස්මක් සිදු වී ඇත.

1981 වසරේ ආර්ථිකයේ ආංශීය ක්‍රියාකාරීත්වය විමසීමේදී වර්ධන මට්ටම එලෙසම පවත්වා ගැනීමෙහිලා විශේෂයෙන් වැවිලි අපනයන භෝග ඇතුළුව, කෘෂිකාර්මික අංශයේ දියුණුව වැදගත් කාර්ය භාරයක් ඉටු කර ඇත. සමස්තයක් වශයෙන් ගත් කල, 1979 දී සියයට 5.7 හා 1980 දී සියයට 10.6 සමඟ සසඳා බලන කල, 1981 වර්ධනය උදෙසා එකී අංශය සියයට 35.5 කින් දායක වී ඇත. 1977 සිට දියත් කරන ලද නිදහස් ආර්ථික ප්‍රතිපත්ති තවදුරටත් පවත්වාගෙන යාම සඳහා වැවිලි කෘෂිකාර්මික භෝග අංශයෙන් සිදු වූ සේවාව හුවා දැක්වීම අනවශ්‍යය. පසුගිය වසර කිහිපය තුළ, වැවිලි කෘෂිකාර්මික අංශයට නොගැනෙන, වී ගොවිතැන ඇතුළුව දේශීය කෘෂිකර්මය ලබා ඇති කැපී පෙනෙන දියුණුව මගින් ආර්ථික වර්ධනයෙහිලා කෘෂි අංශයේ ක්‍රියාකාරිත්වය සැළකිය යුතු මට්ටමකට නංවාලීමට සමත්වී තිබේ. කාර්මික අංශයේ වැදගත් තැනක් ගන්නා වැවිලි කෘෂි නිෂ්පාදන සැකසුම් අංශය මගින් කෘෂිකාර්මික අංශයේ ක්‍රියාකාරිත්වය වැඩි කිරීම පිණිස වූ දායකත්වය සුළු කොට තැකිය නොහැකිය. වෙළෙඳ අනුපාතයේ අහිතකර බලපෑම්වලට මුහුණ පෑමට සිදු වුවද වැවිලි කෘෂි භෝග නිෂ්පාදිතයේ වැඩිවීම සැළකිල්ලට ගත් කල, නියත වශයෙන්ම ගෙවුම් ශේෂය ඉතා ප්‍රබල තත්ත්වයකට පත්වන අතර, ආර්ථිකයේ වෙනත් බොහෝ අංශවල වර්ධනයට බලපාන නිදහස් වෙළෙඳ ප්‍රතිපත්ති තවදුරටත් ඉදිරියට පවත්වාගෙනයාමටද ඉවහල් වනු ඇත.

1978 වසරේ සිට ශ්‍රී ලංකාව ආයෝජනයන්හි විශාල වැඩිවීමක් පෙන්නුම් කර ඇත. කෙසේ වුවද, එමගින් ආර්ථිකයේ යම් වැදගත් ව්‍යුහාත්මක වෙනස්කම් මතුවට ඇති වනු ඇත. කාර්මික අංශයේ අපනයන භෝග සැකසුම් අංශය ප්‍රධාන ලෙස තවදුරටත් ක්‍රියාත්මකව පැවතිණි. කර්මාන්ත අංශයේ ඉතිරි අංශවල පැවැත්ම සඳහා 1981 වසරේදීද, ඛනිජ තෙල් පිරිපහදුවේ ක්‍රියාකාරිත්වය ඉතා වැදගත් ලෙස බලපා තිබේ. මසා නිම කළ ඇඳුම් අපනයන අංශයෙහි වඩාත් ගතික වර්ධනයක් පෙන්නුම් කරන අතර දේශීය රෙදිපිළි භාවිතයෙන් ආර්ථික වර්ධනය උදෙසා එම අංශයේ දායක වීම තවදුරටත් දියුණු කරගත හැකිය.

ශ්‍රී ලංකාව වැනි මූලික ද්‍රව්‍ය නිෂ්පාදනය කරන රටවල් කෙරෙහි ලෝක ආර්ථික වාතාවරණය 1981 වසර තුළ එතරම් සතුටුදායක නොවීය. කාර්මික රටවල පවතින තාවකාලික ආර්ථික පසු බැස්ම, නැඟී එන රැකියා හිඟය, දිගටම පවතින බලශක්ති වියදම්, උද්ධමනය, වැඩි පොළී අනුපාතිකයන්, වෙනස් වන සුළු විනිමය අනුපාතිකයන්, ලෝක වෙළෙඳාමේ ඉතා අඩු වර්ධනයන් සහ ඛනිජ තෙල් හැර මූලික ද්‍රව්‍ය නිෂ්පාදනවල මිළ පහත වැටීම යන කරුණු ශ්‍රී ලංකාව ඇතුළු දියුණු වන රටවල දුෂ්කරතාවයනට තුඩු දී තිබේ. අපනයනය මුල් කර ගත් ආර්ථිකයක් ගොඩ නැංවීමට ශ්‍රී ලංකාව ගන්නා වෑයම ක්‍රියාත්මක කිරීමට සිදු වී ඇත්තේ මුළුමණින්ම අහිතකර ආර්ථික වාතාවරණයක් යටතේ වීම පිළිගත යුතු අවාසනාවන්ත කරුණකි. ලෝකය ගැන විමසා බැලීමේදී, මෑතකදී බලාපොරොත්තු ඇති කර ගත හැකි යහපත් තත්ත්වයක් නොපෙනේ. කෙසේ වුවද, අහිතකර ජාත්‍යන්තර වාතාවරණයක පවතින දියුණු වෙමින් පවත්නා ශ්‍රී ලංකාව වැනි රටවල් වැටී තිබෙන ආර්ථික පරිහානියෙන් ගොඩ ඒමට යත්න දැරීම කැපී පෙනෙන ලක්ෂණයකි. සියයට 5.8 ක වර්ධනයක් පෙන්නුම් කරන ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතය ජාත්‍යන්තර මට්ටමෙන් මැන බලන කල, දියුණු වෙමින් පවත්නා රටවල සාමාන්‍ය වර්ධන අනුපාතිකයට වඩා වැඩි මට්ටමක් පෙන්වයි.

1981 වසරේදීද, ජාත්‍යන්තර වෙළෙඳ අනුපාතය ශ්‍රී ලංකාවේ ආර්ථිකය කෙරෙහි තවදුරටත් අහිතකර ලෙස බලපාන ලදී. 1980 දී, 58 ක් වූ වෙළෙඳ අනුපාත දර්ශකය (1978 = 100) 1981 දී 46 දක්වා පහළ බැස ඇත. ආනයන මිල සමඟ සසඳා බලන කල අපනයන මිල පහළ මට්ටමක පැවතීම හේතුවෙන් ශ්‍රී ලංකාවට රුපියල් දශලක්ෂ 1,406 ක වෙළෙඳ අවාසියක් සිදුවී ඇත. වෙළෙඳ අනුපාතයේ බලපෑම් සඳහා ගලපන ලද මූර්ත ජාතික ආදායම 1981 දී සියයට 3.4 කින්ද, 1980 දී සියයට 3.7 කින්ද, 1979 දී සියයට 2.6 කින්ද වැඩිවී ඇත.

## 1·2 සංඛ්‍යා සටහන

## ස්ථාවර (1970) සාධක වියදම් මිළ අනුව දළ ජාතික නිෂ්පාදිතය

| අංශය | වටිනාකම (රු. දශ ලක්ෂ) | | | | | | ඉකුත් වසරට වඩා වූ වෙනසෙහි ප්‍රතිශතය | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1970 | 1977 | 1978 | 1979 | 1980* | 1981* | 1978 | 1979 | 1980 | 1981 |
| 1· කෘෂිකර්මය, දුව ආදී වන ද්‍රව්‍ය හා ධීවර කර්මාන්තය.. .. .. | 3,732 | 4,299 | 4,532 | 4,622 | 4,766 | 5,097 | 5·4 | 2·0 | 3·1 | 6·9 |
| 2· නිමැවුම් කර්මාන්ත, තැනීම් සහ උපයෝජන සේවා .. .. .. | 2,393 | 3,003 | 3,318 | 3,501 | 3,574 | 3,767 | 10·5 | 5·5 | 2·1 | 5·4 |
| 3· තැනීම් කටයුතු .. .. | 744 | 619 | 794 | 960 | 1,066 | 1,034 | 28·3 | 20·9 | 11·0 | -3·0 |
| 4· වෙළෙඳාම, ප්‍රවාහනය සහ අනෙකුත් සේවා .. | 6,318 | 8,157 | 8,757 | 9,418 | 10,169 | 10,808 | 7·4 | 7·5 | 8·0 | 6·3 |
| 5· දළ දේශීය නිෂ්පාදිතය .. .. | 13,187 | 16,078 | 17,401 | 18,501 | 19,575 | 20,706 | 8·2 | 6·3 | 5·8 | 5·8 |
| 6· විදේශයන්ගෙන් වූ ශුද්ධ සාධක ආදයම .. | – 220 | – 144 | – 72 | – 71 | – 119 | – 438 | — | — | — | — |
| 7· දළ ජාතික නිෂ්පාදිතය .. .. | 12,967 | 15,934 | 17,329 | 18,430 | 19,456 | 20,268 | 8·8 | 6·4 | 5·6 | 4·2 |

* තාවකාලික.

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය සහ දළ ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය 1981 වසරේදී පිළිවෙලින් සියයට 10.7 ක සහ සියයට 18·0 ක සතුටුදයක වර්ධනයක් පෙන්නුම් කර ඇත. 1980 දී භාවිතයට නොගෙන තිබූ තොග මෙම වසරේදී පාවිච්චි කිරීම නිසා ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනයේ ඉහළ මට්ටමක වර්ධන අනුපාතිකයක් ඇති වී තිබේ. රාජ්‍ය අංශයේ ප්‍රාග්ධන සම්පාදනය 1981 දී සියයට 7.6 ක අඩුවීමක් පෙන්නුම් කළද, එකී අංශයේ ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය සියයට 14·0 කින් වැඩිවී තිබේ. රාජ්‍ය සංස්ථා සහ පෞද්ගලික අංශයේ ප්‍රාග්ධන සම්පාදනය 1981 දී සියයට 16.9 කින් වැඩිවී තිබෙන අතර, ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය වැඩිවී ඇත්තේ සියයට 19·0 කින්ය.

ප්‍රාග්ධන සම්පාදනයෙහි විශාලතම වැඩි දියුණුවක් පෙන්නුම් කළේ, විශේෂයෙන්ම, රබර් හා පොල් ඇතුළුව නැවත වගා කිරීම් අංශයේ හා ඉඩම් සංවර්ධන අංශයේ වැඩ කටයුතුවලය. මෑත වර්ෂවලදී සියයට 37 සිට සියයට 30 දක්වා සැහෙන ප්‍රමාණයකින් දේශීය ප්‍රාග්ධන සම්පාදනයෙහි අඩංගු ආනයන ප්‍රමාණය අඩු විය. ඊට හේතු වූයේ මෙතෙක් කල් තිබූ එකවර ක්ෂය කිරීමේ පහසුකම 1981 මාර්තු මස ඉවත් කිරීම නිසා ප්‍රධාන ආයෝජන භාණ්ඩ ආනයනයෙහි සිදු වූ අඩු පරිමාවයි.

දළ දේශීය නිෂ්පාදිතය සහ භාණ්ඩ හා සාධක නොවන සේවා ආනයනය යන අංශවලින් සමන්විත වන, රටෙහි මුළු සම්පත් ප්‍රමාණය මූර්ත වශයෙන් මැන බලන කල, 1981 දී සියයට 5.3 කින් වැඩිවී ඇත. එය 1979 හා 1980 දී පිළිවෙලින් සියයට 11 ක් හා සියයට 8.3 ක් වේ. ආර්ථිකයට ලබා ගත හැකි වූ සම්පත් ප්‍රමාණය අඩුවීම කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා ඇත්තේ, 1980 සමඟ සසඳන කල, 1981 දී භාණ්ඩ හා සාධක නොවන සේවා ආනයනයන්හි වැඩි වීමේ අනුපාතිකය සැළකිය යුතු ලෙස අඩු වීමයි. මුළු සම්පත් ප්‍රමාණයෙහි දේශීය නිෂ්පාදනයෙන් දයක වූ ප්‍රමාණය මේ නිසා සාපේක්ෂ වශයෙන් වැඩිවිය. ආර්ථිකයේ වූ මුළු සම්පත් ප්‍රමාණයෙන් සියයට 62 ක් පරිභෝජනය සඳහාද, සියයට 18 ක් දළ දේශීය ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය සඳහාද, සියයට 20 ක් අපනයනය සඳහාද කැප වී තිබෙනඅතර, 1980 වසරෙහි වූ සම්පත් බෙදී යාමේ රටාවට වඩා මෙහි වෙනසක් නොපෙනේ.

1981 දී රුපියල් කෝටි 1,050 ක් වේ යැයි ඇස්තමේන්තු කර ඇති දේශීය ඉතිරි කිරීම් 1980 දී, රුපියල් කෝටි 740 ක් විය. දළ දේශීය නිෂ්පාදිතයට වූ ඉතිරි කිරීම් අනුපාතය සියයට 12.3 ක් වන අතර එය 1980 දී සියයට 11.2 විය. කෙසේ වුවද, විදේශ රැකියාවන්හි නියුතු ශ්‍රී ලාංකිකයන් විසින් මෙරටට කරන ලද ප්‍රේෂණයන්හි විශාල පරිමාව හේතුකොට ගෙන වැදගත් අංශයක් ලෙස වැඩෙමින් එන විදේශීය ශුද්ධ පෞද්ගලික සංක්‍රාම සඳහා ගලපා සැකසූ කල්හි මුළු ඉතිරි කිරීම් රුපියල් කෝටි 460 කින් වැඩි වෙනැයි ඇස්තමේන්තු කර ඇත. මේ අනුව බලන විට, දළ ඉතිරි කිරීම් අනුපාතය 1980 වසරට වඩා සියයට 16.8 කින් පමණ වැඩි වේ යයි ගණනය කර ඇත. 1980 දී මෙන් දේශීය ඉතිරි කිරීම් හා ආයෝජනය අතර ඇති විශාල පරතරය මෙම වසරේදීද, පියවාගෙන ඇත්තේ ශුද්ධ භාණ්ඩ හා සේවා ආනයන මගිනි.

ආයෝජන ක්‍රියාකාරිත්වය සඳහා කොටසක් දේශීය ඉතිරි කිරීම් වලින්ද, ශේෂය විදේශ සම්පත්වලින්ද ලැබේ. පසුගිය වසර කිහිපය තුළ, ආයෝජන ඉහළ මට්ටමකින් පවත්වා ගැනීමට හැකි වී ඇත්තේ ගෙවුම් ශේෂයේ ජංගම ගිණුමේ විශාල හිඟයන් දරා ගනිමිනි. දේශීය ඉතිරි කිරීමෙහි ලා ඉමහත් රුකුලක් වී ඇත්තේ පිටරට රැකියාවල නියුතු ශ්‍රී ලාංකිකයින් විසින් මෙරටට කරන ලද ප්‍රේෂණයන් වුවද, ආයෝජන උසස් මට්ටමකින් පවත්වාගෙන යාමට දේශීය ඉතිරි කිරීම්වල සැළකිය යුතු දියුණුවක් ඇති කළයුතුව ඇත. 1977 දී සියයට 18.4 ක ඉහළ මට්ටමක පැවති දේශීය ඉතුරුම් අනුපාතය පසුගිය වසර දෙක තුළදී පහත වැටී ඇත. මීට හේතු සාධකව ඇත්තේ ආර්ථිකයේ උද්ධමනකාරී නැඹුරුව හා ඊට මුහුණපා ඇති අයහපත් වෙළෙඳ අනුපාතයේ බලපෑමයි. ඉදිරි වසර කිහිපය තුළදී උසස් මට්ටමක ආයෝජන ක්‍රියාකාරිත්වයක් පවත්වා ගැනීම සඳහා අපනයනයන්හි ප්‍රගතියක් ඇති කිරීම මෙන්ම ආයෝජන සඳහා සම්පත් වල සුලභතාවය වැඩි වන ලෙස ගෙවුම් ශේෂයන් ප්‍රබල කිරීමද අත්‍යවශ්‍ය වනු ඇත.

වර්ෂය තුළ දී මූල්‍ය ප්‍රසාරණය කිසියම් මධ්‍යස්ථ බවක් දැරීය. 1980 වර්ෂයේ දී පෙර නොවූ විරූ තරම් ප්‍රමාණයකින් එනම්, සියයට 81 කින් වර්ධනය වූ දේශීය ණය 1981 දී සියයට 33 ක වඩා අඩු වර්ධනයක් වාර්තා කළේය. 1980 දී සියයට 47 කින් අඩු වූ බැංකු විදේශීය වත්කම් (ශුද්ධ) වඩා අඩු අනුපාතයකින් එනම්, සියයට 19 කින් අඩු විය. මෙම වෙනස්වීම් පිළිබිඹු කරමින්, පටු මුදල් ($M_1$) සියයට 6 කින් වර්ධනය වූ අතර, පුළුල් මුදල් ($M_2$) සියයට 23 කින් වැඩි විය. මූල්‍ය ප්‍රසාරණය මධ්‍යස්ථ ස්වරූපයක් ගැනීමට වර්ෂය තුළ අනුගමනය කළ වඩා හොඳ රාජ්‍ය මූල්‍ය ක්‍රියාදමය හා මූල්‍ය ප්‍රතිපත්තිය යන කරුණු දෙක ම හේතු විය.

වසර මැද දී ක්‍රියාත්මක කළ මූල්‍ය ප්‍රතිපත්තිමය ක්‍රියා මාර්ගවලට අනුකූලතාවය දක්වමින්, වසරේ දෙවැනි භාගය තුළදී මූල්‍ය ප්‍රසාරණය සැළකිය යුතු ලෙස අඩු විය. 1980 දී පැවැති තත්ත්වය අනුව ක්‍රියාත්මක වුන මූල්‍ය ප්‍රතිපත්තිමය ක්‍රියා මාර්ග 1981 දී ද දිගටම ක්‍රියාත්මක කළ අතර, ඇත්ත වශයෙන්ම, එම ක්‍රියා මාර්ගයන් බලවත් කිරීමට සිදු වූයේ වර්ෂයේ පළමු භාගයේ දී දේශීය ණය ප්‍රසාරණය තවදුරටත් ඉහළ මට්ටමක පැවතීම නිසාය. මෙම තත්ත්වය නිසා, 1981 මැයි මාසයේදී පෞද්ගලික අංශයේ ණය ප්‍රසාරණය සීමා කිරීම සඳහා ඉතා සෘජු ක්‍රියා මාර්ගයන් අනුගමනය කිරීමට මහ බැංකුවට සිදු විය. කෙසේ වුවද, මෙම සෘජු ක්‍රම ඉක්මණින් ලිහිල් කැරුන අතර, සාමාන්‍ය ස්වරූපයේ මූල්‍ය ක්‍රියා මාර්ගයන් ක්‍රියාත්මක කරන ලදී. මෙයට අමතරව මහ බැංකුව ආයාචනාත්මක පෙළඹවීම් ස්වරූපයෙන් බැංකු ණය දීම පාලනය කිරීම දිගින් දිගටම කරගෙන ගියේය. පෞද්ගලික අංශයට ණය දීම සීමා කරන මෙන් ජුනි මාසයේ දී වෙළෙඳ බැංකුවලට උපදෙස් දෙන ලදී. මෙකී විධිවිධාන හේතු කොටගෙන සමහර වෙළෙඳ බැංකුවල ණය දීමේ අනුපාතික ඉහළ නැඟුණි. විවිධ ස්වරූපයේ ඉතිරි කිරීමේ උපක්‍රම මගින් තැන්පතු එක් රැස් කිරීමේ උත්සාහය තීව්‍ර කිරීමට බැංකු පොළඹවාලීමට ද මෙම විධිවිධාන සමත් විය. කෙසේ වුවද, තැන්පතු අනුපාතිකයන්ගේ සාමාන්‍ය වර්ධනයක් නොවීය. තැන්පතු ඒකරාශිකරණයේ උත්සාහයන් ඉතාමත් සාර්ථක වූ බව සනාථ වූ අතර, වර්ෂය අවසාන වන විට ප්‍රධාන බැංකුවලට සාමාන්‍ය ද්‍රවශීලතා මට්ටමක් ඇති කර ගැනීමට හැකි විය. බොහෝදුරට තරමක් දැඩි සහ සූක්ෂ්ම මූල්‍ය ප්‍රතිපත්ති පියවරයන්හි ප්‍රතිඵලයක් වශයෙන්, පෞද්ගලික අංශයට (රාජ්‍ය සංස්ථාද ඇතුළුව) දෙන ලද ණය ප්‍රසාරණය 1980 දී සියයට 47 සිට 1981 දී සියයට 27 දක්වා පැහැදිලිව පෙනෙන අඩු වීමක් දක්වීය.

1981 වර්ෂයේදී, මුදල් සහ බැංකු කටයුතු ක්ෂේත්‍රයෙහිද සැළකිය යුතු වර්ධනයන් ඇති විය. අප්‍රේල් මාසයේදී මහ බැංකුව බැංකු ක්‍රමයෙහි අතිරික්ත ද්‍රවශීලතාවය උකහා ගැනීමේ අදහසින් භාණ්ඩාගාර බිල්පත්වල විවට වෙළඳ කටයුතු, එනම්, වෙළෙඳපොලේ ද්විතියික භාණ්ඩාගාර බිල්පත් වෙළෙඳපොල කටයුතු, ආරම්භ කළේය. භාණ්ඩාගාර බිල්පත් සඳහා ක්‍රියාකාරී වෙළෙඳපොලක් බිහිකිරීම සඳහා ද්විතියික වෙළෙඳපොලේදී මහ බැංකුව බැංකුවලට කළ භාණ්ඩාගාර බිල්පත් අලෙවි සියල්ලම මුදල් හා විනිමය බ්‍රෝකර්වරුන් මාර්ගයෙන්ම කරන ලදී. මහ බැංකුව පිහිටවූවාට පසුව පළමු වනාවට එහි සමහර කටයුතු විමධ්‍යගත කිරීමද මෙම වර්ෂයේදී සිදු කෙරුණි. ප්‍රාදේශීය කටයුතු, විශේෂයෙන්ම ග්‍රාමීය අංශයට ණය සැපයීම, නංවාලීමේ අදහසින් බැංකුව සිය පළමු ප්‍රාදේශීය ශාඛාව 1981 මාර්තු මාසයේ මාතරදී විවෘත කරන ලදී. රාජ්‍ය සංස්ථාවලට සහ පෞද්ගලික අංශයට වෙළෙඳ බැංකුවලින් දෙනු ලබන ණය ඇතුළත්වන පරිදි, ශ්‍රී ලංකාවේ පළමුවනාවට, මහ බැංකුව විසින් ජාතික ණය සැලසුමක් හඳුන්වා දෙනලදී. මෙය, මූල්‍ය ප්‍රතිපත්ති සකස් කිරීම, ණය වර්ධනය මෙහෙය වීම සහ ආර්ථිකයේ ප්‍රමුඛත්වය හිමිවිය යුතු අංශ සඳහා ණය පහසුකම් ගලා යාම සහතික කිරීම, සඳහා ප්‍රයෝජනවත් වෙයි. මූලික වශයෙන් 'කළු සල්ලි' (ඉපයූ ආකාරය අනාවරණය නොකළ) ආයතනික අංශයට ගෙන ඒමේ අදහසින් සමහර බැංකු මගින් තැන්පතු සහතික පත් හඳුන්වා දීමද මෙම වර්ෂයේ දී සිදු විය. බැංකු සහ අනෙකුත් ආයතන මගින් තැන්පතු සහතික පත් පිළි වට්ටම් කිරීමේ පහසුකම් ද සලසන ලදී. සමහර වෙළෙඳ බැංකු මගින් දිගු කාලීන තැන්පතු ඇද ගැනීමේ බලාපොරොත්තුව ඇතිව විශ්‍රාම වැටුප් ක්‍රමය, බාල වයස්කාර තැන්පතු ක්‍රමය වැනි බොහෝ අළුත් ඉතිරි කිරීමේ ක්‍රම ඉතාමත් දක්ෂ ලෙස දියත් කරනු ලැබීය. සම්ප්‍රදායික වෙළෙඳ බැංකු කාර්‍යයන්ට ඔවුන්ගේ කටයුතු සීමා කිරීමේ පුරුද්දෙන් ඉවත් වෙමින්, වෙළෙඳ බැංකු ඔවුන්ගේ කටයුතු වණික් බැංකු අංශයන්ට ද පුළුල් කළේය. වර්ෂය තුළ තවත් සැළකිය යුතු ලක්ෂණයක් වූයේ පොලී සඳහා තැන්පතුකරුවන්ගේ ඇති කැමැත්ත පෙන්නුම් කරමින් ඉල්ලුම් තැන්පතු හා සසඳන විට කාලීන සහ ඉතිරි කිරීමේ තැන්පතුවල වර්ධනය විශාල වීමයි. එම හේතුවෙන් බැංකු ක්‍රමයෙහි අරමුදල් සඳහා සාමාන්‍ය පිරිවැය ද වර්ෂය තුළදී

ඉහළ ගියේය. වර්ෂය තුළදී මැදි සහ දිගු කාලීන අරමුදල යටතේ ප්‍රති මූල්‍ය පහසුකම් දිගටම සැපයුන අතර වෙළෙඳ බැංකු වලට සහ ණය දෙන ආයතනවලට අපනයන මූලාශ්‍රිත කර්මාන්ත සංවර්ධනයෙහි ලා පූර්ණ වශයෙන් සහභාගි වීමට ඇති හැකියාව වැඩි කරන ලදි.

එලදයී ඉල්ලුම් පාලන ප්‍රතිපත්තීන් අනුගමනය කිරීම නිසා 1981 වර්ෂයේදී උද්ධමන වේගය තරමක් දුරට මධ්‍යස්ථව පැවති බව පෙනී යයි. නිල ජීවන වියදම් දර්ශකය, එනම්, කොළඹ පාරිභෝගිකයින්ගේ මිල දර්ශකය 1981 වර්ෂයේදී සියයට 18 කින් ඉහළ නැඟුණු අතර කලින් වසරේදී එහි නැගීම සියයට 26 ක් විය. සහල්, තිරිඟු පිටි සහ පාන් මිල වැඩිකිරීම් මෙම වර්ධන යෙන් අඩකට පමණ හේතු විය. ශ්‍රී ලංකා මහ බැංකුවේ තොග අලෙවි මිල දර්ශකයෙහි සාමාන්‍ය වාර්ෂික වර්ධනය 1981 දී සියයට 17 ක් වූ අතර, 1980 දී එය සියයට 34 ක් විය. මෙම වර්ධනයෙන් තුනෙන් දෙකක් පමණ දේශීය ගණයේ භාණ්ඩයන්හි වූ අතර ශේෂය ආනයන ගණයෙහි භාණ්ඩ-යන්හි විය. වේතන අංශයෙන් බලන විට, වර්ෂය අග භාගයේදී රජයේ සේවකයන්ගේ වේතන දර්ශක ගත කිරීමේ විශේෂ දියුණුවක් පෙන්නුම් කරයි. සංවිධානය වූ අංශයෙහි ලා ගැනෙන රජයේ සේවකයන්ගේ සහ වේතන මණ්ඩලවලට අයත් සේවකයන්ගේ මූල්‍ය වැටුප්වල වර්ධන යක් පෙන්නුම් කළද, මූර්ත වැටුප් 1980 වර්ෂයේදී අඩු වූ ප්‍රමාණයට වඩා අඩු අනුපාතිකයකින් 1981 වර්ෂයේදී අඩු වී ඇත. දිවයින පුරා සිටින සංවිධානය නොවූ අංශයේ සේවකයින්ගේ දෛනික වැටුප්, සංවිධානය වූ අංශයේ සේවකයින්ගේ වැටුප් වැඩිවීමට වඩා ඉතා වැඩි වර්ධනයක් පෙන්නුම් කළ අතර, මෙම වැඩිවීම විශේෂයෙන් ම වී වගාව සහ ගොඩනැගිලි ඉදිකිරීම් අංශයේ දක්නට ලැබිණි. කොළඹ පාරිභෝගිකයින්ගේ මිල දර්ශකයෙන් අවපාත කිරීමේදී සංවිධානය නොවූ අංශයේ මූර්ත වැටුප්වලද වර්ධනයක් පෙන්නුම් කරයි.

ලබා ගත හැකි වූ දත්ත අනුව, 1981 වර්ෂයේදී සේවා නියුක්තිය පසුගිය වර්ෂයට වඩා යහපත් ලක්ෂණ පෙන්නුම් කරයි. සංවිධානය වූ අංශයෙහි එනම් රජයේ දෙපාර්තමේන්තු, අර්ධ රාජ්‍ය ආයතන සහ සේවක අර්ථ සාධක අරමුදලට දායක වන ව්‍යවසායයන්හි වර්ෂය තුළ වූ නව රැකියා අවස්ථාවන්හි සම්පූර්ණ වැඩිවීම 40,622 ක් වූ අතර 1979 සහ 1980 වර්ෂවලදී එය පිළිවෙලින් 1,15,000 සහ 18,035 ක් විය. මෙම වර්ධනයෙන් වැඩි කොටසකට දායක වූයේ සංවිධානය වූ පෞද්ගලික අංශයයි. එය 1980 වර්ෂයේදී 3,030 සිට 1981 වර්ෂයේදී 26,156 දක්වා සීඝ්‍ර වර්ධනයක් වාර්තා කළේය. සංවිධානය නොවූ අංශයේ රැකියා වර්ධනය පිළිබඳව නිරවද්‍ය සංඛ්‍යා ලබා ගත නොහැකිය. කෙසේ වුවද, 1981 දී සංවිධානය වූ අංශයේ වූ මූර්ත වැටුප් අඩු වීමට පටහැනි අයුරින් සංවිධානය නොවූ අංශයේ පමණක් මූර්ත වැටුප්වැඩිවීමෙන් මෙම අංශයේ ශ්‍රම සැපයුමට වඩා ඒ සඳහා ඉල්ලුම ඉහළ මට්ටමක පැවතුන බැව් සැලකිය හැකිය. 1978 සිට 1981 දක්වා වූ සිව් වසරක කාලය තුළදී සංවිධානය වූ අංශයෙහි ඇති·වූ මුළු නව රැකියා අවස්ථා වන් 318,847 ක් විය. සේවා නියුක්තියේ මෙම අඩු වන ප්‍රවනතාවය ඉදිරි වසර කිහිපයේදී තව-දුරටත් පවත්වාගෙන යාම සඳහා වාර්ෂිකව ශ්‍රම වෙළෙඳපොලට ඇතුළු වේ යයි ඇස්තමේන්තු කර ඇති 1,25,000 ක පුද්ගලයිනට රැකියා සැපයීම සඳහා වාර්ෂිකව රැකියා අවස්ථාවන් වඩාත් සීඝ්‍රයෙන් වර්ධනය කළයුතුව ඇත.

මිළ ස්ථායීකරණය තවදුරටත් කළහැකි වනුයේ දේශීය නිෂ්පාදන මට්ටම, ආනයන හැකියාව, රජයේ අයවැය හා මුදල් හා ණය වර්ධනය අනුවය. ආනයන හැකියාව අවසානයේදී අනිවාර්යයෙන්ම අපනයන ක්‍රියාකාරිත්වය හා වෙළෙඳ අනුපාතය මගින් තීරණය කෙරේ. අපනයන මුල් කොට ගත් උපක්‍රමයක් අවශ්‍යයෙන්ම මැදි හෝ දිගුකාලීන ඉලක්කයක් විය යුතුය. දේශීය කෘෂිකර්මයේ හා කර්මාන්තයේ නිෂ්පාදනය, වෙනත් දෑ අතර, ණය පිරිවැය හා ඉතිරි කිරීම් මත රඳා පවතී. අධික උද්ධමන වේගයක් පැවතීමෙන් ඉතිරිකිරීම් දිරි නොගැන්වීම පමණක් නොව ඉහළ පොළී ප්‍රමාණයන් දිගින් දිගටම පවත්වාගෙන යාමට හේතුවීමෙන් නොවැළැක්විය හැකි පරිදි ණය පිරිවැය ඉහළ යාමද එමගින් සිදු වේ. මේ හේතුවෙන් කෙටි කාලීන වශයෙන් ඉතිරි කිරීම් හා ආයෝජන දිරි ගන්වන මිළ ස්ථායීකරණයක් පවත්වාගෙන යා හැක්කේ අයබදු ප්‍රතිපත්තියත්, මූල්‍ය ප්‍රතිපත්තියත් මගිනි. මිළ ස්ථායීකරණයේ අවශ්‍යතාවය මගින් අයබදු හා මූල්‍ය සීමාවන් පැනවීමේ අවශ්‍යතාවය යටපත් වී යයි.

මූල්‍ය හා අයබදු ප්‍රතිපත්තීන් ආර්ථික ස්ථායීකරණයේ සාර්ථක ක්‍රියා මාර්ගයන් බවට පත්වීම සඳහා ඒවාට පොදු අරමුණක් තිබිය යුතුය. ව්‍යාප්ත කෙරෙන සුළු අයබදු ප්‍රතිපත්තියක් අනුගමනය කරන විටකදී සීමා කරන සුළු මූල්‍ය ප්‍රතිපත්තියක් අනුගමනය කිරීමෙන් ඇතිවන බලපෑම ඉතා අල්පය. 1979 න් පටන් ගත් අයබදු ව්‍යාප්තියෙන් දේශීය ණය ගැනීම් වැඩිවූ අතර ශුද්ධ විදේශීය සංචිත වලින් හැර ගැනීම් ද තීව්‍ර වී ගියේ ය. විදේශීය සංචිත අඩුවීමෙන් පටු මුදල් ($M_1$) හා පුළුල් මුදල් ($M_2$) යන මූල්‍ය ස්කන්ධ දෙක කෙරෙහිම, සංකෝචනාත්මක බලපෑමක් ඇති වන බව සත්‍යයකි එහෙත් අධික දේශීය ණය ප්‍රසාරණයක් හිළුව කිරීම සඳහා එවැනි මූල්‍ය සංකෝචනයක් තිබීමෙන් ණය සඳහා ඉල්ලුම සීමා වන්නේ නැත.

පුළුල් වශයෙන් සළකනවිට, රාජ්‍ය මූල්‍ය ක්‍රියාමාර්ගයන් නිසා සැළකිය යුතු අසමතුලිත තාවයක් ඇතිවීමට යෙදුන සහ එම හේතුවෙන් ගෙවුම් ශේෂයේ විශාල හිඟයක් වාර්තා වීමට යෙදුනු 1980 වර්ෂයට වඩා, 1981 වසරේ දී ශ්‍රී ලංකාවේ ආර්ථික ක්‍රියාකාරිත්වය සැළකිය යුතු සමස්ත වර්ධනයක් පෙන්නුම් කර ඇතැයි කිව හැකිය. මූලික වශයෙන්, 1981 වසර තුළදී ක්‍රියාත්මක වුනු හිතකර ඉල්ලුම් හසුරුවා ලීමේ ප්‍රතිපත්ති හේතු කොට ගෙන අයවැය හිඟය දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 24 සිට සියයට 17 දක්වාද, ගෙවුම් තුලනයෙහි වූ ජංගම ගිණුම් හිඟය දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 16 සිට සියයට 11 දක්වා ද පහත වැටුණි. ඇතැම් පාලිත මිළ ගණන් කලින් කල ඉහළ දමනු ලැබුවද, මූලික වශයෙන්, යහපත් වූ අයවැය තත්ත්වය පිළිබිඹු කරමින් උද්ධමන වේගය අඩු විය. රජයේ වියදම් අඩු කිරීම හා ඒ හා අදළ දැඩි පාලනය, ණය දීමේ හැකියාව හා ණය පිරිවැය කෙරෙහි බලපෑම් ඇති කරන අනුපූරක මූල්‍ය ක්‍රියාමාර්ග සහ එකවර ක්ෂය වීමේ දීමනාව ඉවත් වීමට ඉඩ හැරීම යනාදිය ඇතුළත් පුළුල් ක්‍රියා මාර්ගයන් මෙම වර්ධනයන්ට මූලික වශයෙන් හේතු විය. ශ්‍රී ලංකාව සහ එහි ප්‍රධාන වෙළෙඳ හවුල්කරුවන් අතර පැවති උද්ධමන ප්‍රමාණයන්ගේ වෙනස්කම් තරමක් දුරට අහවමින්, වසර තුළදී ඇතැම් ප්‍රධාන ජාත්‍යන්තර ව්‍යවහාර මුදල් හා බැඳුණු විනිමය අනුපාතිකය තවදුරටත් අවප්‍රමාණ විය. මෙමගින්, ශ්‍රී ලංකාවේ අපනයනයන්ට අත්වන තරඟකාරී වාසිය අඩුවී යා නොදී රැක ගන්නා ලදී. මෙම ගැලපුම්, පීඩාකාරී වුවද, විශේෂයෙන්ම 1980 වසරෙහිදී, ආර්ථිකයෙහි හටගත් දැඩි අසමතුලිතතාවය හමුවේ අත්‍යවශ්‍ය වූයේ විය. මෙබඳු ප්‍රතිපත්තීන් ක්‍රියාත්මකව තිබියදීත් 1981 වසර තුළදී, සමස්ත ආර්ථික වර්ධනයක් දක්නට ලැබීම ධෛර්‍යය එලවන සුලුය. ශ්‍රී ලංකාවෙහි වඩාත් ප්‍රබල ආර්ථික ක්‍රියාකාරිත්වයක් තවදුරටත් ඇති විය හැකි බවට මෙය ඉතා පැහැදිලි සළකුණක් විය. මේ අයුරින් බලන කල 1981 වසරෙහිදී ඇති වූ ප්‍රගතිය පැසසුම් කටයුතුය.

රාජ්‍ය මූල්‍ය කටයුතු සළකා බලන කල, 1981 හි අයවැය තත්ත්වය 1980 වසරට වඩා යහපත් බවක් පෙන්නුම් කරයි. අයවැය හිඟය දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 24 සිට සියයට 17 දක්වා අඩු වූ අතර, බැංකු ක්‍රමයෙන් ණය ගැනීම් දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 11 සිට සියයට 5 දක්වා පහත වැටුනි. මුළු ආදායමෙහි සියයට 15 ක වැඩිවීමක් වූ අතර, මුළු වියදම සියයට 3 කින් පමණ ඉහළ නැගුණි. කෙසේ වෙතත්, රජය තමන්ගේම ඉතුරුම් උපදවා ගැනීම් මගින් ප්‍රාග්ධන වියදමෙහි කොටසක් පියවීමට අපොහොසත්වීම අඟවමින් වර්තන ගිණුමෙහි හිඟයක් වාර්තා කළේය.

1977 සිට වසරක් පාසා සම්පත් සංචලනය සඳහා රජය දැරූ ප්‍රයත්නය බෙහෙවින් ඉහළ මට්ටමක පැවතුණි. රජය මෙහිලා නිරත වීමට ප්‍රධාන කරුණු දෙකක් හේතු විය. ප්‍රථමයෙන්ම, අපනයන මිල ගණන්වල ඇති වන අයහපත් උපනතීන් හමුවේ, ඵලදායී නිෂ්පාදන ආන්තික පවත්වා ගෙන යාමේ අවශ්‍යතාවය නිසා අපනයන බදු අනුපාතික පහත දැමීම හෝ තවදුරටත් විනිමය අනුපාතිකය පහත හෙළීම හෝ එම කරුණු දෙකම හෝ අවශ්‍යය. එමනිසා අපනයන බදු ආදායම රජයේ මුළු ආදායමෙහි ප්‍රධාන අංගයක්ව පැවතීම බෙහෙවින් අවදනම් සුළු තත්ත්වයන් ඇති කළහැකි සේ සළකනු ලැබේ. දෙවනුව, බදු ආදායමෙහි වර්ධනය ඉකුත් සිව් වසර තුළ පැවති උද්ධමනාත්මක උපනතීන්ට අනුව හැඩගැසී ඇත්තේ මද වශයෙනි. මෙම උපනතිය 1981 දීද පැවතුණි. සියයට 0.54 ක සංවේදීතාවයක් පමණක් පිළිබිඹු කරමින් 1980දී ද. දේ. නි. යට වූ ආදායම් අනුපාතිකය සියයට 21 සිට 1981 දී සියයට 19 දක්වා පහත වැටුණි.

මිල ඉහළ යෑම වඩාත් ඍජුව බලපාන විශාල ආයෝජන වැඩ පිළිවෙලක් හමුවේ ආදායමේ ප්‍රමාණවත් නොවන වර්ධනය, අයවැය හිඟයේ ප්‍රමාණය වැඩිකිරීමට හේතු විය. වැඩිවෙමින් පවතින අයවැය හිඟයේ මූල්‍යකරණ අවශ්‍යතා සපුරාලීමට ඉහළ යමින් පවත්නා විදේශීය ආධාර සහ බැංකු නොවන ණය මට්ටම් පවා ප්‍රමාණවත් නොවීය. තවද, රාජ්‍ය අංශය හා පෞද්ගලික අංශය අතර සම්පත් සඳහා තියුණු තරඟයකටද එය හේතුවිය. මේ නිසා ඇතිවන "සම්පත් ඉවතට ඇදීයාමේ" ප්‍රතිඵලය, සමස්ත ඉල්ලුම් හසුරුවාලීමේ ගැටළු උග්‍ර කරවයි. මෙය විශේෂයෙන්ම, රාජ්‍ය අංශයෙහි ආයෝජනයන්ට සාපේක්ෂව, පෞද්ගලික අංශය සතු ආයෝජනවල ඵල ලැබීමේ කාලසීමාව අඩුවීම නිසා සිදුවන්නකි. එසේම, අයවැය හිඟය පියවීම සඳහා ඉකුත් දෙවසර තුළදී වඩාත් වියදම් සහිත විදේශීය ණය ගැනීමෙහි වැඩිවීමක්ද දක්නට ඇත. විශේෂයෙන්ම, ජාත්‍යන්තර පොළී අනුපාතික ඉහළ මට්ටමක පවත්නා අවදියකදී විදේශීය වාණිජ ණය ගැනීම අධික වියදම් දරන්නකි. මෙම මූල්‍යකරණ මාර්ගය අයවැය පියවීමෙහිලා බැංකු ක්‍රමයේ පිහිට පැතීම සීමා කිරීමට උපකාරී වුව ද, ණය සේවාකරණ ගැටළු උද්ගත කිරීමට ද හේතු විය.

ආදායමෙහි නාමික වැඩිවීමට බදු ක්‍රමයෙහි ප්‍රතිචාරය අඩුවීම රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය කෙරෙහි වෙනත් බලපෑම්ද ඇතිකරවයි. ආදායම් බලධාරින්ගේ ක්‍රියාත්මක කිරීමේ ප්‍රයත්නයන්හි දුර්වලතාවයන් (උදා: ව්‍යාපාර පිරිවැටුම් බද්ද) නිසා හෝ සලසා ඇති විවිධ බදු නිදහස් කිරීම් නිසා හෝ මෙසේ නම්‍යතාවයක් නොමැති වුවද එම අඩුව පියවීමට නිරතුරුවම බදු ක්‍රමයෙහි අවස්ථාවෝචිත හා විචක්ෂණ වෙනස්කම් ඇති කිරීමට රජයට අත්‍යවශ්‍යයෙන්ම සිදුවන බව මෙහිලා සඳහන් කළයුතුය. මේ අනුව, සාධාරණ බදු අනුපාතිකයන් සහිත ස්ථායී බදු ක්‍රමයකින් අපේක්ෂිත ඉලක්කය කරා එළඹීම දුෂ්කර කාර්යයක් වේ. තවදඍජු බදු මත ප්‍රදානය කරනු ලබන බදු දිරිගැන්වීම් නිසා එහි බදු බර සාපේක්ෂ වශයෙන් ප්‍රතික්‍රමිකවූ ද ජීවන වියදමට මෙන්ම ආදායම් ව්‍යාප්තියටද බලපෑම් ඇති කරවන්නාවූද වක්‍ර බදු මඟින් දැරිය යුතු වේ.

වෙළඳ අංශයෙහි, ඉල්ලුම් පාලන ප්‍රතිපත්තීන් සමස්ත ක්‍රියාවලිය වැඩි දියුණු කර ඇති බවට බලාපොරොත්තු සහගත ලකුණු විය. වසර තුළදී, ආනයන (රුපියල් දශලක්ෂ 35,251) වලට වඩා අපනයන (රුපියල් දශලක්ෂ 20,585) වේගවත් අනුපාතිකයකින් වර්ධනය විය. ඇත්ත වශයෙන්, ආනයනයන් ගලා ඒම ක්‍රමානුකූලව සීමා වීම සැළකිය යුතු තරම් විය. වඩාත් ස්ථායි විගැහි භාවිතයෙන් 1980 වසර තුළ සියයට 41ක වැඩිවීමක් පෙන්නුම් කළා වූ ආනයන වර්ධන අනුපාතිකය 1981 වසර තුළදී ආන්තික වශයෙන් සුළු අඩුවීමක් පෙන්වා ඇත. කෙසේ වෙතත්, වෙළෙඳ තුලනය නොකඩවා හිඟයක්ව පැවතුණි. රුපියල් දශ ලක්ෂ 14,666ක් වූ වෙළෙඳ හිඟය 1980 වසර තුළ සටහන් වූ හිඟයට වඩා සියයට 10 කින් අඩු විය. අපනයන වර්ධන අනුපාතිකය 1981 වසර තුළ වැඩි වුවද, තවමත් පහළ මට්ටමක පැවති අතර, වසර තුළ සියයට 21කින් අඩු වූ වෙළෙඳ අනුපාතයේ පිරිහීමක් මඟින් ප්‍රශ්නය තවත් අවුල් සහගත කරනු ලැබීය. කෙසේ වුවද, අපනයන අංශයේ සමස්ත ක්‍රියාවලිය සර්ව ශුභවාදී අදහස් වලට ඉඩකඩ සළසයි. තේ හැර අනිකුත් ප්‍රධාන අපනයන භාණ්ඩවල අපනයන පරිමාවන්හි වර්ධනයක් දිස් විය. 1981 වසර තුළ අපනයනවල වඩා ඉහළ වර්ධනයක් ඇතිකිරීම සඳහා රෙදිපිළි සහ ඇඳුම් පැළඳුම්, සුළු අපනයන කෘෂිකාර්මික නිෂ්පාදිත සහ කාර්මික අපනයන වලින් ලත් වැඩි වූ අපනයන ඉපයීම් විශාල ලෙස හේතු විය. ආනයන පාර්ශ්වයෙන්, වර්ෂයේ ආරම්භයේදී එක්වර ක්ෂය කිරීමට ඉඩදීමේ අනුග්‍රහය ඉවත් කර ගැනීමේ ප්‍රතිඵලයක් වශයෙන් ආනයන අංශයෙහි ආයෝජන භාණ්ඩයන්ගේ අඩු වීමක් පෙන්වීය. මුළු අපනයනවලින් පාරිභෝගික භාණ්ඩවල කොටස ස්ථාවරව පැවති අතර, අන්තර් භාණ්ඩවල කොටසේ වැඩිවීමක් දිස්විය.

1980 සමඟ සසඳන විට, 1981 දී ශ්‍රී ලංකාවේ ගෙවුම් තුළනයෙහි සැළකිය යුතු දියුණුවක් දක්නට ලැබිණ. 1980 දී විශාල සමස්ත ගෙවුම් ශේෂ හිඟය වූ විගැහි දශ ලක්ෂ 166 (රුපියල් දශ ලක්ෂ 2,967) සමඟ සසඳන කල එය 1981 දී විගැහි දශ ලක්ෂ 26 (රුපියල් දශ ලක්ෂ 406)ක් විය. වඩා හොඳ මූල්‍ය පාලන ප්‍රතිපත්ති සහ නම්‍ය විනිමය අනුපාතික ප්‍රතිපත්ති මෙම වර්ධනයට උපකාරී වූ අතර, එය අඩු වූ වෙළෙඳ හා ජංගම ගිණුම් හිඟයක් තුළින් පිළිබිඹු විය. පටු වූ වෙළෙඳ

හිගයත් සමඟ පෞද්ගලික ප්‍රේෂණ සහ නිළ සංක්‍රාම විශාල ලෙස ගලා ඒමෙහි ප්‍රතිඵලය වූයේ පෙර වර්ෂයට වඩා සැළකිය යුතු ලෙස අඩුවූ ජංගම ගිණුම් හිගයක් 1981 දී පෙන්වීමය. සමස්ත ගෙවුම් තුලන ශේෂ හිගය මධ්‍යස්ථ ප්‍රමාණයක පැවතීමට උපකාරී වූයේ ඍජු ආයෝජන, කෙටි-කාලීන ණය සහ සැළකිය යුතු ප්‍රමාණයකින් ලැබුණ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ආධාර ඇතුළුව විදේශ ණය ලෙස ගලා ආ ප්‍රාග්ධනයය. මෙම හිගය පියවීමේ දී කැපී පෙනෙන ලක්ෂණය වූයේ, විදේශ ආධාර, ණය, ප්‍රදාන සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලින් හැර ගැනීම් වැනි සම්ප්‍රදායික මාර්ග වලින් ලැබුණ සම්පත්වල සීමිත භාවය හමුවේ රාජ්‍ය අංශයේ සංස්ථා හා රජය යන දෙඅංශයම වැඩි වශයෙන් වෙළෙඳ ණය ලබා ගැනීමට පෙළඹීමයි. කෙසේ වුවද, 1981 දී විදේශ සම්පත් පරතරයෙන් වැඩි කොටසක් පියවුනේ මූල්‍ය නොවන ප්‍රාග්ධනය මගිනි

1981 වර්ෂය තුළ දළ විදේශ වත්කම් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 2,456 (විගැහි දශ ලක්ෂ 91.4)කින් වැඩි වූ අතර, ශුද්ධ විදේශ වත්කම් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 406 (විගැහි දශ ලක්ෂ 26) ක අඩු වීමක් පෙන්නුම් කරන ලදී. 1981 වර්ෂය අවසානයේ පැවති දළ විදේශ වත්කම් ප්‍රමාණය දෙමසක ආනයන සඳහා පමණක් ප්‍රමාණවත් විය. 1980 වර්ෂයේ සමස්ත ණය සේවා අනුපාතය (ජාත්‍යන්තර මූල්‍ය අරමුදල් ණය හා රාජ්‍ය අංශයේ සැපයුම් කරුවන්ගේ ණය ඇතුළුව) සියයට 12.4 සිට 1981 දී සියයට 13.4 දක්වා වැඩිවූ අතර, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ගණුදෙනු වලින් බැහැරව මෙම ණය අනුපාතය සියයට 7.5 සිට 1981 දී 6.8 දක්වා අඩු විය.

වර්ෂය තුළ ක්‍රියාවට යොදන ලද ප්‍රතිපත්ති සමුදය අතර විනිමය අනුපාතික සහ තීරු බදු ප්‍රතිපත්තිද ඇතුළත් විය. වර්ෂය තුළදී අනුගමනය කළ නම්‍ය විනිමය අනුපාතික පාලන ප්‍රතිපත්තිය ගෙවුම් තුළනය මත වූ පීඩනය ලිහිල් කිරීමට උපකාරී විය. 1981 දී පනවන ලද අංක 69 දරණ පිරිවැටුම් බදු පනත සමඟ ක්‍රියාත්මක කරන ලද, ආනයන බදු ව්‍යුහය පරිමේයකරණය කිරීම අපේක්ෂා කළ සංශෝධනයක් විය. ආනයන බදු, ආරක්ෂිත කොටස සහ ආදයම් කොටස යනුවෙන් බෙදූ අතර, පසු සඳහන් කරන ලද කොටස, එනම්; පිරිවැටුම් බද්ද, දේශීය සම නිෂ්පාදන වෙනුවෙන් පනවනු ලැබිණි. නව බදු ව්‍යුහය මගින් රේගු බදු වල ආරක්ෂිත භාවයෙහි වඩා හොඳ අගැයීමක් සහතික කළ යුතුවූ අතර, ඒවා ආදයම් පරමාර්ථය සහ ගෙවුම් තුලන පරමාර්ථය යන අරමුණු දෙක සඳහා සඵලදයක ලෙස යොද ගැනීමට හැකි විය යුතුය. අත්‍යවශ්‍ය නොවන භාණ්ඩ ආනයනද ඒවා කැපී පෙනෙන ලෙස පරිභෝජනය කිරීම ද අධෛර්‍යමත් කිරීමත්, දේශීය වශයෙන් ආරක්ෂාව සැළසිය යුතු කර්මාන්ත ආරක්ෂා කරමින්, එවැනි භාණ්ඩ නිෂ්පාදනය කිරීමත් අවශ්‍යය. අනාගතයේදී වරණීය ලෙස තීරු/පිරිවැටුම් බදු වැඩි කිරීමට පදනමක් සකස් කිරීමට එකී බදු ව්‍යුහය ඉවහල් විය හැක.

දැනට පවත්නා තීරු බදු ව්‍යුහය වූ කලී 1977 අවසාන භාගයේ ක්‍රියාත්මක කරන ලද ලිහිල් කිරීමේ විධිවිධාන වලට කලින් එම වසරේදී අවස්ථානුකූලව ඇති කරන ලද වෙනස්කම්වල මූලික ප්‍රතිඵලයකි. එවක් පටන් දැනට පවත්නා තීරු බදු ව්‍යුහය මගින් කාර්මික අංශයට සැලසෙතැයි සැලකෙන ආරක්ෂණයේ අවශ්‍යතාවය සහ එහි ප්‍රතිඵලයන් අගැයීම සඳහා ප්‍රමාණවත් උත්සාහයක් දැරූ බවක් දක්නට නැත. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් සම්පත් අනිසි අයුරින් යෙදවීමකට තුඩු දෙන ප්‍රමුඛතාවෙන් තොර වූ අංශවල ආයෝජනයන් කෙරේ විශේෂත්වයක් තිබිය හැකිය. තීරු බදු ව්‍යුහය එලෙසින්ම පැවැත්ම අපනයන කර්මාන්තවලට සාපේක්ෂව ආනයන ආදේශක කර්මාන්ත කෙරෙහි විශේෂත්වයක් දක්වන අහිතකර බලපෑමකට තුඩු දීමට ද පුළුවන. මේ අනුව ඵලදායී ආරක්ෂණයක් මත පදනම් වූ ක්‍රමවත් තීරු බදු ව්‍යුහයක් ඇති කිරීම ඉක්මණින් සැළකිල්ලට ගත යුතුය. ලෝක බැංකුවේ තාක්ෂණික ආධාර සහිතව ඵලදායී ආරක්ෂණ මට්ටම පිළිබඳ අධ්‍යයනයක් කිරීමට පියවර ගැනීමෙන් මේ පිළිබඳ මූලික කටයුතු 1980 වර්ෂයේදී ආරම්භ කරන ලදී. මේ කාරණය පිළිබඳව සොයා බැලීමට පත්කර තිබෙන තීරු බදු පිළිබඳ ජනාධිපති කොමිසම මගින් මෙය වඩාත් පුළුල් පදනමක් මත ඉදිරියට ගෙන යෑම ඉක්මණින් කළ යුතුවේ.

ශ්‍රී ලංකාවේ ගෙවුම් තුලනය මූල ස්වරූපීය ප්‍රශ්නයක් වන අතර, විදේශීය ගෙවුම් ස්ථාවරත්වයක් ඇති කිරීම සඳහා මූලික වෙනස්කම් ඇති කිරීම අවශ්‍යය. මෙය කෙටි කාලයක දී මුදුන්පත් කරගත නොහැක. 1981 දී මෙන්, කෙටි කාලීන ස්ථායීකරණ ප්‍රතිපත්ති වැඩි වශයෙන් යොමු විය යුත්තේ ඉල්ලුම් පාලනය කෙරෙහිය. කෙසේ වුවත්, මැදි කාලීන හා දිගු කාලීන ප්‍රතිපත්ති සකස් කළ යුත්තේ අපනයන වර්ධනය හා විවිධාංගීකරණය මගින් දිගු කාලීන ස්ථාවරත්වයක් ගොඩ නැංවීම සඳහාය. මසා නිම කළ ඇඳුම් සහ ශුද්ධ ඛණිජ තෙල් නිෂ්පාදන ඇතුළත්වූ

කාර්මික අපනයනවල වර්ධනයක් ඇතිව අපනයන ව්‍යුහයේ වෙනස්වීමක් සිදු වී තිබුණ ද, මෙම කර්මාන්ත අපනයනය කරන්නේ බොහෝ සෙයින් ඉහළ මට්ටමක වූ ආනයන මත රැඳී පැවතුන නිෂ්පාදිතයන්ය. සාමාන්‍යයෙන් දේශීය වශයෙන් එකතු වූ වටිනාකම ඉතා පහත මට්ටමක පවතී. ශ්‍රී ලංකාව වැනි කුඩා ආර්ථිකයක මෙවැන්නක් නොවැළැක්විය හැකි කරුණක් වන අතර, දේශීය වශයෙන් එකතු කළ වටිනාකම වැඩි කරන අංශවල වර්ධනයක් ඇති වන අයුරින් ආනයන ප්‍රතිපත්ති සකස් කිරීම ඉතා ඉක්මණින්ම කළ යුතුව ඇත.

වෙළෙඳපොළ නිදහස් තත්ත්වයකට ගෙන ඒමට වී වගා අංශයෙන් ලැබුන පිටිවහල ද රජයේ මැදිහත් වීම අඩුවීම ද දිරි ගන්වන සුළු කරුණු විය. මෙසේ සිදු වූයේ, ඉකුත් තෙවසර තුළදී නිෂ්පාදන වියදම් වැඩිවෙමින් තිබියදීත් ය. දැනට සිදුවන පරිදි, හුදෙක් යථාරූපී පදනම් මිලක් ක්‍රියාත්මක කිරීම තුළින් රජයේ මැදිහත් වීමක් ඇතිව, වෙනත් ක්ෂේත්‍ර භෝග නිෂ්පාදකයන්ගෙන් ද එකී අන්දමේම පිටිවහලක් ලැබෙනු ඇතැයි අපේක්ෂා කිරීමට සෑම සාධාරණ හේතුවක්ම ඇත. 1981 වර්ෂයේ දී සුළු කෘෂිකාර්මික භෝග අපනයන ඉතා සතුටුදායක විය. නිසි දිරිගැන්වීම් ලැබුණ හොත්, සුළු කෘෂිකාර්මික භෝග නුදුරු අනාගතයේදී රටේ අපනයන ඉපැයීම් වලින් සැළකිය යුතු ප්‍රමාණයකට තවදුරටත් දයක වනු ඇත.

නිෂ්පාදකයින් දිරි ගැන්වීමේ ක්‍රම පවත්වා ගෙන යාම රජයේ අභිලාෂය වූ බව පැහැදිළි වූ අවස්ථා වර්ෂය තුළ දී දක්නට ලැබුණි. බදු ආදායම අඩු වුව ද, නිෂ්පාදකයිනට ප්‍රමාණවත් ලාභ ආන්තිකයන් ලබා දීමේ අදහසින්, තේ, රබර් සහ පොල් සඳහා වූ අපනයන බදු පහත හෙළන ලදී. අපනයන වෙළෙඳාම පිළිබඳව තිබූ සීමා කිරීම් ලිහිල් කිරීමෙන් වැඩි වාසියක් සැළසුණේ පොල් අපනයන වෙළඳාමටය. දේශීය අංශය පිළිබඳව කිව යුත්තේ, යෙදවුම් වල අධික මිල සැලකිල්ලට ගෙන, වී බුසලක සහතික මිල, වර්ෂය තුළදී රු. 2.50 කින් සහ රු. 5.00 කින් දෙවරකට වැඩි වී රුපියල් 57.50 ක් විය. තවද, අතුරු ආහාර භෝග සඳහා ද පදනම් මිල ක්‍රමයක් ඇති කරන ලදී. එසේම, එකී භෝගවල නිෂ්පාදනය කෙරෙහි බලපෑමක් ඇති කරන තිරිඟු පිටිවල මිල ද වැඩි කරන ලදී. සිය ක්‍රියාවලියෙහි කිසියම් දියුණුවක් පෙන්වූ පාඩු ලබන සංස්ථාවනට අයවැයෙන් දෙන ලද ගෙවීම් වලද සැළකිය යුතු අඩුවීමක් ඇති විය. නිදහස් අර්ථ ක්‍රමයක් ඇති කිරීමේ දී මුහුණ පෑමට සිදුවන විශාලතම ගැටළුවලින් එකක් වූයේ පාරිභෝගිකයනට 'සාධාරණ' මිල ගණන් සහතික කරන අතරම, නිෂ්පාදකයාටද වාසිදායක ලාභ ආන්තිකයන් ලබා දීම සහතික කරලීමය. පාරිභෝගිකයනට අවාසි වුවද නිෂ්පාදක ආන්තිකය වැඩි කිරීම මෙම ක්‍රියාදමයන් රැසකම ඉලක්කය වූ අතර, ඒවා බොහෝ විට ඒ අයුරින්ම රජයේ ආදායමද සැළකිය යුතු ලෙස අඩුවන සුළු ආකාරයට ගැනීමට සිදු වූ දුෂ්කර තීරණ විය.

බලශක්ති ප්‍රතිපත්තිය රටට බොහෝ සෙයින් බලපාමින් පැවැති ප්‍රශ්නයක් විය. පසුගිය අවුරුදු කිහිපය තුළ රට මුහුණ පෑ විශාල වෙළෙඳ හිඟයට එක් හේතුවක් වූයේ ශීඝ්‍රයෙන් වැඩි වෙමින් පැවැති බොර තෙල් හා ඛනිජ තෙල් නිෂ්පාදනවල ආනයන වියදමය. 1981 දී ඛනිජ තෙල් ආනයන වියදම මුළු ආනයන වියදමෙන් සියයට 25ක් වූ අතර, එය මුළු අපනයන ආදායමෙන් සියයට 42ක් වැය කර දැමීය. මහවැලි යෝජනා ක්‍රමයේ ජල විදුලි නිෂ්පාදනාගාරවල විදුලිය නිෂ්පාදනය ආරම්භ වන තෙක් රටේ බල ශක්ති අඩුව පිරිමැසීම සඳහා වැඩි වියදමක් සහිත ගෑස් ටර්බයින් පාවිච්චි කිරීමට සිදු වී ඇති නිසා, නුදුරු අනාගතයේදී ඛනිජ තෙල් හා ඛනිජ තෙල් නිෂ්පාදන අපනයන වැඩිවීමට පුළුවන. කෙතරම් අවශ්‍ය වුවත්, ශ්‍රී ලංකාවට සිය සම්පත් මේ අන්දමට එකම ආනයන භාණ්ඩයක් වෙනුවෙන් වැයකර දැමීම දිගටම කරගෙන යා නොහැකිය. මේ තත්ත්වය නිසා ජාතික බලශක්ති සංරක්ෂණය කිරීමේ ප්‍රතිපත්තියක් වහාම සකස් කළයුතුව තිබේ. මෙයට අති විශේෂ ප්‍රමුඛත්වයක් දිය යුතුය. කෙටිකාලීන වශයෙන් සැපයීම පුළුල් කිරීමේ උපක්‍රම සැළසුම් කිරීම හා ඒකාබද්ධ වූ හොඳ ඉල්ලුම් කළමනාකාරිත්ව ප්‍රතිපත්තියකුත්, දිගුකාලීන වශයෙන් විකල්ප බලශක්ති සම්පත් සොයා බැලීමත් ඉතා වැදගත් වන්නේය.

ආවෘත ආර්ථිකයක් වෙළෙඳපොලේ බලවේග විසින් බොහෝ දුරට මෙහෙයවනු ලබන විවෘත ආර්ථිකයකට හැරෙන විට ඒ සඳහා හැඩ ගැසීමේදී බොහෝ ප්‍රශ්නවලට මුහුණ පාන්නට සිදු වන්නේය. පාලනයන්ගෙන් හෙබි ආර්ථික ක්‍රියාවලියක් ලක්ෂණ කරගත්, කලින් පැවති ආර්ථික ක්‍රමයේ ශේෂ වූ අංග සමහරක් තවදුරටත් පැවතුණ අතර, සම්පත් බෙද හැරීම සම්බන්ධයෙන් විෂමතා ඇති කිරීමට ඒවා හේතු විය. 1981 දී ආර්ථිකය, එකී හැඩගැස්ම නිසා උද්ගත වූ බාධක හා පීඩනවලට නියතවශයෙන්ම හසු විය. අන්තර් ජාතික උද්ධමනය හා අවාසිදායක වෙළෙඳ අනුපාතයන්ද මෙම තත්ත්වය තවදුරටත් උග්‍ර කළේය. කරුණු මෙසේ වුවද, 1981 දී ශ්‍රී ලංකා ආර්ථිකය, සමස්ථයක් වශයෙන් ගෙන බලන කල, 1980 වර්ෂයට වඩා සැහෙන දියුණුවක් ලබා ඇති බව ප්‍රකාශ කළ හැකිය.